# Linux OS – ලිනක්ස් මෙහෙයුම් පද්ධතියෙ තියන දේවල්

ලිනක්ස් සමග ක්‍රියා කලහැකි මෙහෙයුම් පද්ධති විශාල ප්‍රමාණයක් දැකගත හැකියි. බොහෝ ලිනක්ස් මෙහෙයුම් පද්ධති නොමිලයේ ලබාදෙන අතර අනෙකුත් පද්ධති ඉතා කුඩා මුදලකට අලෙවි කරනු ලැබේ. ලිනක්ස් මෙහෙයුම් පද්ධතිය තුල windows වල command prompt මෙන් command line interface(CLI) භාවිත වේ. තවද Graphical ආකාරයෙන්ද කටයුතු කල හැක. අප බොහෝවිට කැමති මෙම Graphical ආකාරයටයි. නමුත් එමගින් සිදුවන්නේ අප විසින් තවත් මෙහෙයුම් පද්ධතියක් පිළිබදව ඉගෙන ගැනීම පමණකි. එමනිසා ඔබත් ලිනක්ස් ඔස්සේ ඉදිරියට යාමට කැමති නම් command line interface(CLI) භාවිතයට හුරුවන්න. එවිට ඔබට විවිධ ලිනක්ස් මෙහෙයුම් පද්ධති සමග කටයුතු කල හැකිවේ.




**විවිධ ලිනක්ස් මෙහෙයුම් පද්ධති**

RedHad, Fedora, Ubuntu, Kubuntu, edubuntu, Mandrike, Novell, Suse, Debian, Sun OS, Gentoo, Knoppix……….

## මේවා ලිනක්ස් වල පහසුවෙන් කරන්න පුළුවන්

බොහෝ පරිගණක භාෂාවන් ලිනක්ස් වලට ආවේනික වන අතර C, C++, C#, Java, Tcl, Python, Perl, PHP වැනි පරිගණක භාෂාවන් ලිනක්ස් සමග ඉතා පහසුවෙන් කරගැනීමට අවශ්‍ය මෘදුකාංග පැමිණේ. මෙම නිසා අමතර Programing මෘදුකාංග ඇතුලත් කරගැනීමක් හෝ එවැනි Programing මෘදුකාංග සදහා අමතර මුදල් වැයකිරීමක් සිදුකලයුතු නැත.

## වින්ඩෝස් වගේද?

ලිනක්ස් පැමිණ බොහෝ කාලයක් ගතවනතුරු එහි පැවතියේ command line interface(CLI) පමණි. එමනිසා ලිනක්ස් එතරම් ජනප්‍රිය නොවීය. නමුත් අදවනවිට ලිනක්හි ඇති Graphical user interface(GUI) නිසා කෙමෙන් ජනප්‍රිය වෙමින් පවතී. වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියේ ඇති රූපමය ආකාරය ලිනක්ස් හිදී වින්ඩෝස් වලටත් වඩා නිර්මාණශීලීව හා ඉතා පහසු ආකාරයෙන් ඉදිරිපත් කර ඇත. මේ සදහා විවිධ winows systems භාවිත කර ඇත.

**windows Systems**: xwindows, xfree86




Edubuntu Desktop

## ඩෙස්ක්ටොප් එකක් තියනවද?

ලිනක්ස් වල එක ඩෙස්ක්ටොප් එකක් පමණක් නොව විවිධ ඩෙස්ක්ටොප් මාදිලි දැකගතහැක. විශේෂයෙන් බොහෝ ලිනක්ස් මෙහෙයුම් පද්ධතිවල KDeskdop(KDE) දැක ගත හැක. විවිධ ඩෙස්ක්ටොප් අපටද නිර්මාණය කර භාවිත කිරීමටද හැකිවන්නේ ලිනක්ස් වල පමණී.

**Desktop environments**: Gnome, KDE, GNUstep, XFce

## එතකොට ඉන්ටනෙට්?

ලිනක්ස් වල දි අන්තර්ජාලයට සම්බන්ධවීම සදහා Morzila firefox වෙබ් බ්‍රව්සරය භාවිතා කරයි.




## වැඩසටහන් ගොඩාක් තියනවා

ලිනක්ස් වල විවිධ කාර්යයන් කලහැකි වැඩසටහන් රාශියක් අන්ර්ගතයි. වින්ඩෝස් තුල ඇති වැඩසටහන් වලින් කරන බොහෝ දේ මෙමගින් ද කල හැකියි.

උදාහරණ --

**In Windows: Photoshop = In Linux: Gimp**
**In Windows: Microsoft Office = In Linux: OpenOffice**
**In Windows: Calculator = In Linux: calc**
**In Windows: Media Player = In Linux: Movie Player**
**In Windows: Internet Explorer = In Linux: Mozilla**
**and more…..**




openoffice document

www.eduLanka.com
info@eduLanka.com